2019 අගෝස්තු 03 යොමු අංකය: 1920 -001

# 2019-2020 අධ්‍යයන වසර සඳහා සිසුන් බඳවා ගැනීම

ඩුබායි දහම් පාසලේ 2019 -2020 අධ්‍යයන වසර සඳහා නවක සිසුන් බඳවා ගැනීම

2019 සැප්තැම්බර් මස 13, 20 සහ 27 සිකුරාදා දින තුළ,

පෙ.ව. 8:45 සිට දහවල් 10.30 දක්වා ද,

ප.ව. 12:45 සිට සවස 3:00 දක්වා ද,

ඩුබායි කොන්සල් ජනරාල් කාර්යාලයේ පිහිටි දහම් පාසල් පරිශ්‍රයේදී සිදුකෙරෙනු ඇත.

**සුදුසුකම්:**

**1** වසර සඳහා දරුවන් ඇතුලත් කිරීම: **2019 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 6 සම්පූර්ණ කරන දරුවන්** හට 2019 2020 අධ්‍යයන වසරට ඇතුලත් වීමට සුදුසුකම් ලබනු ඇත. මේ සඳහා අවශ්‍ය ලේඛන සහ වැඩි විස්තර, කොන්දේසි මාලාව සහ අයදුම් පත කියවීමෙන් ලබාගත හැක.

**2** වසර **3** වසර පන්ති සඳහා දරුවන් ඇතුළත් කිරීමක් සිදු නොකෙරෙන බව කරුණාවෙන් දැනුම් දෙමු.

**4** වසර සිට **8** වසර පන්ති සඳහා දරුවන් ඇතුළත් කිරීම සඳහා සිංහල, බුද්ධාගම සහ අපේ උරුමය විෂයයන් ආශ්‍රිතව සරල ලිඛිත සහ වාචික පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, දරුවන් ලබාගන්නා ප්‍රතිඵල අනුව දහම් පාසලේ කමිටුවේ අනුමැතිය මත පන්තිවලට අනුගත කරනු ලැබේ. එම දරු දැරියන්ගේ වයස 2019 දෙසැම්බර් මස 31 වැනිදාට අවුරුදු නවයක් (9) සම්පූර්ණ විය යුතුය. පරීක්ෂණය පැවැත්වෙන දිනය අපගේ වෙබ් අඩවියෙන් හෝ සංවිධාක කමිටුව විසින් දැනුම් දෙනු ඇත.

**අයදුම්පත් භාරදීම:**

දහම් පාසලට දරුවෙකු ඇතුල් කිරීමට බලාපොරොත්තු වන සියලුම දෙමාපියන් පහත පියවර අනුගමනය කළ යුතුය:

පියවර 1: කොන්දේසි මාලාව 2019-2020 හොඳින් කියවීම.

පියවර 2: පෙර දැනුම් දීම පෝරමය සම්පූර්ණ කිරීම. **මෙම පෙර දැනුම් දීමේ පෝරමය දහම් පාසලට දරුවන් ඇතුළත් කිරීමේ අයදුම් පත නොවන බව** කරුණාවෙන් දැනුම් දෙමු.

පියවර 3: නිසියාකාරව සම්පූර්ණ කළ අයදුම් පත සහ කොන්දේසි මාලාව අදාළ ඇමිණුම් සමග ඉහත දිනයන්හීදී සංවිධායක මණ්ඩලය වෙත පුද්ගලිකව පැමිණ භාරදීම. මෙදින දරුවාගේ ලියාපදිංචි අංකය සහ ශිෂ්‍ය වාර්තා පොත සහ අනෙක් අවශ්‍ය පොත් ලබාදෙනු ඇත.

**පෙර දැනුම් දීම පෝරමය** සම්පූර්ණ කරන්න **මෙතැනින්**.

**අයදුම් පත සහ කොන්දේසි මාලාව** ලබා ගන්න **මෙතැනින්**

සැ.යු. නියමිත දිනට පසුව හෝ email මගින් එවන අයදුම් පත්‍ර භාර නොගන්නා බව අවධාරණය කරමු.

වැඩි විස්තර ලබා ගැනීම සඳහා ලියන්න: email: dahampasaladubai@gmail.com

ස්තුතියි,

සංවිධායක මණ්ඩලය